සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි (MN 03)

( කෘෂිකර්ම උපදේශක) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන :

1.1 දෙපාර්තමේන්තුව : සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

යොමු අංකය : AS/A/4/RP දිනය : 2019.03.13

1.2 අමාත්‍යාංශය : සබරගමුව පළාත් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශය

යොමු අංකය : AM 01 05 08 දිනය: 2019.03.14

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : 2013.01.01 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය

1.4 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : දිනය :

1.5 සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : PPSC/ES/06/FT/01 දිනය : 2019-04.05

1.6 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය:

යොමු අංකය : ........................... දිනය : ................

02. පත් කිරීමේ බලධාරියා : සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික
අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය

3.2 ශ්‍රේණි : III, II , I ශ්‍රේණිය සහ විශේෂ ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය පිළිබඳ පොදු නිර්වචනය :
විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳ පුහුණුව ලබාගත යුතු, ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්බක වන්නා වූ මූල්‍ය, මානව, භෞතික, ද්‍රව්‍යමය තාක්ෂණික දත්ත හා සම්පත් අධීක්ෂණය , මෙහෙයවීම හා කළමනාකරණය යන කාර්යයන් ඇතුළත් බහුකාර්යය ස්වරූපයෙන් යුත් අර්ධ වෘත්තීය සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම සුදුසුකම් ලත් හා පුහුණුව හා පළපුරුද්ද මත කළමනාකරණ සේවා වන කෘෂිකර්ම වෘත්තීමය සේවාවට පරිපූරක වන්නා වූ කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

යොමු අංකය :- GS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
දිනය:- 2019.05.17 සබරගමුව පළාත.

3.4. කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨත්වය කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

05. වැටුප

5.1 වැටුප් කේත අංකය : III, II , I ශ්‍රේණි - ( MN-03-2016)
විශේෂ ශ්‍රේණිය - (MN-07-2016)

5.2 වැටුප් පරිමාණය : . III, II , I ශ්‍රේණි - රු. 31040-10x445-11x660-10x730-10x750-57,550*
විශේෂ ශ්‍රේණිය - රු.41,580 – 11 x 755-18 x 1030 -රු.68,425 *

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු) |
|---|---|---|
| III ශ්‍රේණිය | 1 | රු.31,040 * |
| II ශ්‍රේණිය | 12 | රු.36,150 * |
| I ශ්‍රේණිය | 23 | රු.43,480 * |
| විශේෂ ශ්‍රේණිය | 04 | රු.43,845 * |

සටහන
*2016.02.25 දිනැති අංක 03/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපලේඛණ i අනුව ඉහත වැටුප් පරිමාණය 2016.01.01 දින සිට අදියර 05 කින් උපලේඛණ ii හි සඳහන් පරිදි ක්‍රියාත්මක කෙරෙන අතර මෙම වැටුප් පරිමාණයට එලබෙන්නේ 2020 වසරේදීය. රජය මගින් කලින් කලට කරනු ලබන සංශෝධනයන්ටද යටත්වේ.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| කෘෂිකර්ම උපදේශක | III, II, I | 144 | කෘෂිකාර්මික සංවර්ධන කටයුතු,කෘෂි ව්‍යාප්ති කටයුතු, පර්යේෂණ තොරතුරු,අත්හදා බැලීම් ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති,කෘෂිකාර්මික තාක්ෂණය ගොවි ජනතාවට හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම,කෘෂිකාර්මික න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම තුලින් කෘෂි ව්‍යවසායකයින් බිහි කිරීම, ගොවිපල් කළමනාකරණයට අදාල මූල්‍ය අධීක්ෂණය,මානව සම්පත් කලමනාකරණය හා පරිපාලනය |
| කෘෂිකර්ම උපදේශක (විශේෂ ශ්‍රේණිය) | විශේෂ ශ්‍රේණිය | 15 | මානව, භෞතික සම්පත් අධීක්ෂණය, කෘෂිකර්මය හා බැඳුනු කාර්යයන් අධීක්ෂණය හා කෘෂිකාර්මික න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් කෘෂි ව්‍යවසායකයින් බිහි කිරීම. |

යොමු අංකය :- CS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14.....දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:-2019.05.17

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 144
විශේෂ ශ්‍රේණිය නිලධර සංඛ්‍යාව : 15

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ. විශේෂ ශ්‍රේණියේ අනුමත සංඛ්‍යාව ඉහත ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් නොවේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් : පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාල නොවේ |

සටහන :-

I. III, II, I යන ශ්‍රේණීන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් මෙම පළාත් සභාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගයකින් තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කරගත හැකිය.

III. පුරප්පාඩු සංඛ්‍යාව 03ට අඩු නම් බඳවාගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

7.2 විවෘත බඳවා ගැනීම :

යොමු අංකය :- ගස/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

බඳවා ගන්නා ශ්‍රේණිය : .III ශ්‍රේණිය (විවෘත)

7.2.2. සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

BIOLOGY

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ජෛවීය විද්‍යා විෂය ධාරාව ( ජීව විද්‍යාව සමග රසායන විද්‍යාව ,භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන්ගෙන් 2ක්) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ (ජෛව පද්ධති තාක්ෂණවේදය ,තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව) විෂයන් තුනකින් එකවර සමත්ව තිබීම.( සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයක් ලෙස ගණන් නොගැනේ)

සහ

මවුබස( සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව), විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06)අධ්‍යාපන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : .

( I ) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනම ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(II) කුණ්ඩසාලේ,අඟුණකොළපැලැස්ස,පැල්වෙහෙර,බිබිල,ලබුදූව,වාරියපොළ, වව්නියාව, අනුරාධපුර ,කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(III) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම

හෝ

(IV) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6 ) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(V) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (කෘෂිකර්ම) ලබා තිබීම.

යොමු අංකය :- GS/ES/13/3/26
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නැත

7.2.2.4 කායික සුදුසුකම් :

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

සෑම අපේක්ෂකයකුම සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

7.2.2.5 වෙනත් :

I. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි.

III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට පළාතේ වසර 03ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුල සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

V. සේවයට බඳවා ගැනීම සඳහා වන විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාල සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.2.3 .වයස

7.2.3.1 අවම සීමාව : අවු.18ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවු.30ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත තරඟ විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල පදනම්කර ගනිමින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය % |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | 100 | 40 |

(ඇමුණුම් 01 හි විෂය නිර්දේශය දක්වා ඇත.)

7:2:4:1:1 ලිඛිත විභාගය පවත්වන බලධාරියා : විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නැත

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : සබගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නැත

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : අදාල නැත

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : පුවත්පත් දැන්වීමක් හෝ සබරගමුව පළාත් සභා වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ දැන්වීම් පල කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

යොමු අංකය :- ආඩ/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:- 2019.05.17

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

මවුබස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) ,ගණිතය සහ විද්‍යාව යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය විෂයන් හයකින් සමත් වී තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :- ඉහත 7:2:2:2 ඡේදයේ සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් ලබා තිබීම

7.3.2.3 පළපුරුද්ද :- ඉහත 7:2:2:2 හි වෘත්තීය සුදුසුකම් සමග අදාල ක්ෂේත්‍රයේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්ද ලබා ඇති ප්‍රාථමික හෝ ඉන්ඉහළ සේවා ගණයක ස්ථිර,දෙපාර්තමේන්තුගත තනතුරක සේවකයකු වීම .

7.3.2.4. කායික සුදුසුකම් :

සබරගමුව පළාත් තුල ඕනෑ ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

7:3:2:5 වෙනත්:

I. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු යැයි අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම අකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

II. සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටීම.

III. නියමිත දිනට පූර්වාසන්නව සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර ඉහත 7:3:2:3හි සඳහන් තනතුරක යටත් පිරිසෙන් අවුරුදු පහක (05) ක අඛණ්ඩ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව : අදාල නැත

7.3.3.2 උපරිම සීමාව : . සීමිත ධාරාවෙන් බඳවා ගැනීම සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

යොමු අංකය :- ගස/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14.....දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත තරඟ විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂනයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත දිස්ත්‍රික් කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය % |
|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 2.විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්ණ පත්‍රය | 100 | 40 |

(ඇමුණුම් 02 හි විෂය නිර්දේශය දක්වා ඇත)

7.3.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලබන අභ්‍යන්තර චක්‍රලේඛයක් මගින්

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාල නොවේ

යොමු අංකය :- [illegible]S/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

දිනය:- 2019.05.17
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

8. කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවයලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව /වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත්වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (විෂය නිර්දේශය ඇමුණුම 03) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (විෂය නිර්දේශය ඇමුණුම 04) |
| 3.වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගත වීමට පෙර | කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින්

පළමුවනවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

යොමු අංකය :- ගs/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්, සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ

තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවකි

සටහන : මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ 1 ශ්‍රේණියට උසස්වී වසර පහක් (05) සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

9.1 භාෂා ප්‍රවීණතාව

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව | ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අ.පො.ස.(සා/පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් III වන ශ්‍රේණියේ වසර 5ක් ඉක්මවීමට පෙර ලබාගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම්

10.1 III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

යොමු අංකය :- සප/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.
දිනය:- 2019.05.17
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. උසස්වීම් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10 )ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයා ගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහය (10) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. 9 වන ඡේදයේ සඳහන් පරිදි භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම

VI. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයා ගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර 05 තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

*සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස්වීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණය සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුයි.

10.3 I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| සීමිත තරඟ විභාගයෙන් | 40% |
| සේවා පළපුරුද්ද හා කුසලතාවය | 60% |

සටහන : විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේදී පුරප්පාඩු ගණනය කළ යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

I. අනුමත තනතුරු සංඛ්‍යාව 04ක් වන විට සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පලපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 75% ක් විය යුතු අතර අනුමත තනතුරු සංඛ්‍යාව 03ක් වන විට ඉහත සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 66.67 %ක් විය යුතුය.

යොමු අංකය :- SG/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019 . 05 . 14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019 . 05 . 17

II. විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 03කට වඩා අඩු වේ නම්, නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත තනතුරුවල පුරප්පාඩු පිරවීම සිදුකළ යුතුය.

10.3.2 සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගැනීම

10.3.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික ( MN -3 ) සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහම (05) නියමිත දිනට උපයා ගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම

10.3.2.2 බඳවා ගන්නා ආකාරය

පත්වීම් බලධරයා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් අදාල සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීමේ බලධරයා විසින් සිදුකරනු ලබයි. (විෂය නිර්දේශය ඇමුණුම 5)

සටහන

I. විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අදාල කරගත යුතු වන්නේ එම විභාගය අදාල වන්නා වූ වර්ෂයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

II. වාර්ෂිකව එම විභාගය පැවැත්වීමට නොහැකි වුයේ නම් ඊට පසු වර්ෂයක පැවැත්වෙන විභාගයක ප්‍රතිඵල එක් එක් වර්ෂවල පැවති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට අදාල කරගනු ලැබේ.එහිදී ඒ ඒ වර්ෂවල පුරප්පාඩු ඇති වූ දිනයන්ට සුදුසුකම් ලැබූ නිලධරයන් ලකුණු අනුපිළිවෙල අනුව තෝරා ගනු ලබන අතර විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරන දිනය ලෙස සළකනුයේ එම විභාගය පැවැත් වූ දිනය වේ.

10.3.3. සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගැනීම

10.3.3.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික ( MN -3 ) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර (06) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හයම (06) නියමිත දිනට උපයා ගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හයක් (06 )ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම

යොමු අංකය :- ගS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 ......දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.1

10.3.2.2 බඳවා ගන්නා ආකාරය

පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබාදෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාල සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි. (විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ඇමුණුම් 06 )

යොමු අංකය :- ගස/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.
දිනය: 2019.05.17 ආණ්ඩුකාරවර ලේකම්, සබරගමුව පළාත.

11.තනතුරුවලට පත්කිරීම: අදාළ නොවේ

12.1. පරිවාස කාලය හා සේවය ස්ථිර කිරීම

I.විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරියෙකු වසර 03ක පරිවාස කාලයකට යටත් වේ. ඔහු / ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව ඇත්නම් හා පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ.

II.සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරීන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ඇය වැඩ බැලීමේ කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම්,වැඩ බැලීමේ කාලය අවසානයේදී සේවයේ ස්ථිර කරනු ලැබේ.

12.2.රජය විසින් කලින් කළ තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා සහ නිපුණතාවයන් ද සියළුම නිලධරයන් විසින් නියමිත පරිදි ලබා ගත යුතුය.

13. අර්ථ නිරූපණ

I. ''ගැසට් නිවේදනය'' යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය වේ.

II. ''බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය'' යන්නෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක බඳවා ගැනීමේ පරිපාටියයි.

III. ''ප්‍රධාන'' ලේකම් යනුවෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා වේ.

IV. ''ලේකම්'' යනුවෙන් අදහස් කරනුයේ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා වේ

V. ''දෙපාර්තමේන්තු ප්‍රධානියා''යනුවෙන්අදහස් කරනුයේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාවේ

VI. ''ක්‍රියාත්මක වන දිනය'' මෙම බඳවා ගැනීමේ පරිපාටිය ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා ක්‍රියාත්මක වන 2013.06.01 දින සිට ක්‍රියාත්මක වේ.

VII. ''සේවය'' යනුවෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවය වේ.

VIII ''සතුටුදායක සේවා කාලය'' යනුවෙන් අදහස් කරනුයේ රජයේ නිලධාරියකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරී ඉටු කිරීම මගින්ද සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වීම මගින්ද ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද එම කාලය තුළදී උපයා ගතයුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

IX. '' සක්‍රීය සේවා කාලය'' යනුවෙන් අදහස් කරනුයේ වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුලත් නිලධාරියකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

යොමු අංකය :- ගS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14.........දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවරයාගේ ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

14. අන්තර්ග්‍රහණ විධිවිධාන

1.මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ මගින් ලබාදී ඇති MN -3-2006-A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධරයන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

11.සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය.කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදුනොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය.එසේම වැටුප් පරිවර්ථනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූප වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

14.1 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට සේවයේ නියුතු නිලධරයන් නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය යටතේ සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණ කිරීම පහත සඳහන් ආකාරයට සිදු කරනු ලැබේ.

14.1.1 සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණ කිරීම.

මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක II වන පන්තිය (ආ) ඛණ්ඩයේ සිටින නිලධරයන් III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.1.2 සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණ කිරීම.

මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක II වන පන්තිය (අ) ඛණ්ඩයේ සිටින නිලධරයන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.1.3 සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණ කිරීම.

මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක I වන පන්තිය සිටින නිලධරයන් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.1.4 සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණ කිරීම.

මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියේ සිටින නිලධරයන් විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15.අන්තර්කාලීන විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන 2018.06.01දක්වා බලපැවැත්වේ.මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන III හා II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන නිලධාරීන්ට උසස්වීම් ලබාදීමේදී අන්තර්කාලය තුළ දී අදාල කරගත යුත්තේ 2006.01.06 දිනැති අංක 1426/34 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව සකස් කර 2005.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමතව ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.1 අ සහ 7.2 අ වගන්ති වේ.( මෙම අන්තර්කාලීන විධිවිධාන අදාල වන්නේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති 2005.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමතව ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථා යටතේ බඳවා ගත් නිලධරයන්ට පමණි) අනෙකුත් කොන්දේසි නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අනුව වේ.

16. වෙනත්

16.1

1.මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ ලද පසු ගරු ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන :..........................................

පරීක්ෂා කළේ : ..........................................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

යොමු අංකය :- ගS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14......දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
දිනය:-2019.05.17 සබරගමුව පළාත.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

( දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : ..........................................
කේ. පී. කරවිට
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමුව)
පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
නවගම - රත්නපුර

තනතුර: ..........................................

දිනය : 2019.03.13..........

නිල මුද්‍රාව : ..........................................

යොමු අංකය : AM.01.05.08

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම:

ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය

ජී. සුනිල් ප්‍රේමචන්ද්‍ර
ලේකම්
ඉඩම්, පළාත් මාර්ග, කෘෂිකර්ම ... නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර

දිනය : 2019.03.14 නිල මුද්‍රාව : ..........................................

---

යොමු අංකය : DCSPT/07/R2/10/AGM/DEP/01

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි හි කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම: ඩී.එම්. මාලනී

ප්‍රධාන ලේකම්

ඩී. එම්. මාලනී
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත

දිනය : 2019.03.25. නිල මුද්‍රාව : ..........................................

යොමු අංකය :- GS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

යොමු අංකය : PPSC/ES/04/FT/01

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි හි කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................

නම - සුනේත්‍රා ගුණවර්ධන

ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සබරගමුව පළාත

දිනය : 2019.04.09

නිල මුද්‍රාව : සුනේත්‍රා ගුණවර්ධන ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සබරගමුව පළාත, පළාත් සභා සංකීර්ණය - රත්නපුර

---

යොමු අංකය ....................................

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි හි කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ............................. දින සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

යොමු අංකය :- GS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

අත්සන: ..........................................

නම: ..............................................

ආණ්ඩුකාරවර ලේකම්

සබරගමුව පළාත

දිනය : ..............................

නිල මුද්‍රාව : ............................................

ඇමුණුම 01

**විභාග වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර**

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණසේවා ගණය ( කෘෂිකර්ම උපදේශක) III ශ්‍රේණියට බඳවාගැනීමේ විවෘත තරඟ විභාගය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01යි | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03යි | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා: පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාව අනුව පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව,විශ්ලේෂණ හැකියාව,කාල කළමණාකරණය, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| විෂයානු බද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | (1) ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය<br>(2) ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිලිබඳ දැනුම.<br>(3) පස හා ශාක පෝෂණය<br>(4) වී නිෂ්පාදනය.<br>(5) වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය<br>(6) එලවළු නිෂ්පාදනය<br>(7) පළතුරු<br>(8) බෝග ආරක්ෂණය<br>(9) පාශු රසායන පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම |

ගොනු අංකය :- සප/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

| | |
|---|---|
| | (10) වාරි මාර්ග ක්‍රම හා ජල කලමණාකරණය<br><br>(11) ගොවිපල් යාන්ත්‍රීකරණය<br><br>(12) මී මැසිපාලනය<br><br>(13) මල් වගාව හා භූමි අලංකරණය<br><br>(14) ආරක්ෂිත භෝග වගාව<br><br>(15) සත්ව පාලනය<br><br>(16) කෘෂිකාර්මික ව්‍යාප්තිය<br><br>(17) පටක රෝපණය<br><br>(18) පැලෑටි නිරෝධායනය පිළිබඳ දැනුම<br><br>(19) (අ) ශාක සංරක්ෂණයේ වැදගත්කම(ශාක/ජානප්ලාස්ම)<br>(ආ) ශාඛ සංරක්ෂන ක්‍රම(ශාක/ජාන ප්ලාස්ම)<br><br>(20) ජාන තාක්ෂණය<br><br>(21) කෘෂිකර්ම සංවර්ධනය<br>වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත්කම කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය සම්බන්ධ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන,මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තාමේන්තුවට අයත් ආයතන, මධ්‍යස්ථාන, අංශ, ඒකක හා ඒවායේ කාර්යභාරය. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාර වන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් වලය. |

සකස් කළේ : අත්සන :....................................

පරීක්ෂා කළේ : ..................................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

අත්සන :..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : ..................................................

තනතුර : ..............................................

දිනය : ...............................................

නිල මුද්‍රාව : ..........................................

යොමු අංකය :- GS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:2019.05.17

කේ. සී. කරවිට
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමු)
පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
මුවගම - රත්නපුර

## විභාග වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණය ( කෘෂිකර්ම උපදේශක) නිලධාරින්ගේ III ශ්‍රේණියට බඳවාගැනීමේ සීමිත තරඟ විභාගය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| **ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය** | **කාලය** | **මුළු ලකුණු** | **සමත් ලකුණු** |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය** | **පැය 01යි** | **100** | **40%** |
| **විෂයානු බද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය** | **පැය 03යි** | **100** | **40%** |

03. පවත්වනු ලබන බලධරයා: සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ විභාග කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාව අනුව පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| **ප්‍රශ්න පත්‍රයේ නම** | **විෂය නිර්දේශය** |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | ක්ෂේත්‍රයට අදාල දැනුම මැන බැලීම පිළිබඳ බහුවර්ණ ප්‍රශ්න වලින් සමන්විතය. |
| විෂයානු බද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | (1) ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය<br>(2) නව උසස් තාක්ෂණික කෘෂිකර්මාන්තය<br>(3) ආරක්ෂිත ගෘහ තුළ භෝග වගාව<br>(4) නිර්පාංශු භෝග වගාව<br>(5) ක්ෂුද්‍ර ජල සම්පාදනය<br>(6) සත්ත්ව පාලන අපද්‍රව්‍ය හා ඒවා කෘෂි භෝග නිෂ්පාදනයට හා වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම<br>(8කුඩා පරිමාණ සත්ත්ව ගොවිපලක් සැළසුම් කිරීමේදී සලකා බැලිය යුතු කරුණු<br>(8) සත්ත්ව පාලනය පිළිබඳ පරිසර නීති |

යොමු අංකය :- ගස/ ES/1/3/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම් සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

| | |
|---|---|
| | (9) මධ්‍යම පරිසර අධිකාරිය,නගර සභා, පළාත් සභා,පළාත් පාලන නීතිරීති හා සමාජ වටාපිටාව පිළිබඳ දැනුම<br><br>(10) කෘෂිකර්මාන්තයට සම්බන්ධ පනත්<br><br>(11 ගිවිසුම් පිළිබඳ දැනුම මැන බැලෙන ප්‍රශ්න වලින් යුක්තය. |

සකස් කළේ : අත්සන :.................................................

පරීක්ෂා කළේ : .................................................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

අත්සන: .................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා )
නම : .................................................
තනතුර : .................................................
දිනය : 2019.03.13
නිල මුද්‍රාව : .................................................

කේ. පී. කරවිට
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමුව)
පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
මූවගම - රත්නපුර

යොමු අංකය :- SG/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:-2019.05.17

ඇමුණුම 03

**විභාග වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර**

01. විභාගයේ නම : සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක නිලධාරින්ගේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| **ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය** | **කාලය** | **මුළු ලකුණු %** | **සමත් ලකුණු %** |
|---|---|---|---|
| **කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය** | **පැය 02 යි** | **100** | **40** |
| **මුදල් රෙගුලාසි** | **පැය 02 යි** | **100** | **40** |

03. පවත්වනු ලබන බලධරයා: සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ විභාග කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| **ප්‍රශ්න පත්‍රයේ නම** | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්රහය | ආයතන සංග්‍රහයේ VIII, XII,XIII,XIV.XIX පරිච්ඡේද |
| මුදල් රෙගුලාසි | I වන පරිච්ඡේද<br>මුදල් රෙගුලාසි 01 සිට 68 දක්වා<br><br>III වන පරිච්ඡේද<br>මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා |

යොමු අංකය :- SG/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:-2019.05.17

අත්සන: ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : ........................................ ඇස්. පී. කරවිට

තනතුර : ........................................ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමුව) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

දිනය : 2019.03.13 මවගම - රත්නපුර

නිල මුද්‍රාව : ........................................

ඇමුණුම 04

## විභාග වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර

01.විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණ සේවා ගණය (කෘෂිකර්ම උපදේශක) නිලධාරින්ගේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 යි | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 යි | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා: සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ විභාග කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ආයතන සංගහයේ XV , XVI , XXIII , XXIV, XXV , XXVII ,XXVIII , XXX/XXXIII, XLVII, XLVIII, පරිච්ඡේද |
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ<br>(1) VI වන පරිච්ඡේදය<br>මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා<br>(2) XIIIවන පරිච්ඡේදය<br>(මු.රෙ.685 සිට 775 දක්වා) |

යොමු අංකය :- පසේ/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්,
දිනය:- 2019.05.17 සබරගමුව පළාත.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා )
නම : ..............................
තනතුර : ..............................
දිනය : ..............................
නිල මුද්‍රාව : ..............................

කේ. පී. කරවිට
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමුව)
පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
මිවගම - රත්නපුර

ඇමුණුම 05

## විභාග වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ කෘෂිකර්ම උපදේශක I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 යි | 100 | 40% |
| කළමනාකරණය | පැය 03 යි | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා: සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ විභාග කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :අවශ්‍යතාවය පරිදි වසරකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |
| කළමනාකරණය | I.කළමනාකරණ මූලධර්ම<br>II.කළමනාකරණ ශ්‍රිතයන් , සැළසුම් කිරීම,තීරණ ගැනීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය, සංවිධානය, මාණ්ඩලිකරණය, මෙහෙයවීම, අභිප්‍රේරණ ක්‍රියාවලිය, නායකත්වය, පාලනය, පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය<br>III.සහභාගිත්ව කලමනාකරණය<br>IV. කළමනාකරණ පරිසරය<br>V.සිද්ධි අධ්‍යයනය |

යොමු අංකය :- කෘ/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:- 2019.05.17

අත්සන: ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : කේ. පී. කරවිට

තනතුර : පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමුව) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මුවගම - රත්නපුර

දිනය : 2019.03.13

නිල මුද්‍රාව : ..............................

ඇමුණුම 06

## විභාග වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණ සේවා ගණය (කෘෂිකර්ම උපදේශක) I වන ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| <u>සේවා පළපුරුද්ද</u><br>අදාළ මූලික සුදුසුකම් ඉක්මවා සපුරා ඇති සක්‍රිය හා සතුටුදායක I වන ශ්‍රේණියේ වසරක සේවා කාලයට ලකුණු 05 බැගින් වසර 10 කට | 50 |
| <u>කුසලතාවය</u><br>කාර්ය සාධනය (ආසන්න වසර 05 සඳහා )<br>ඉතා හොඳයි 05<br>හොඳයි 04<br>සතුටුදායකයි 03 | 25 |
| පරිගණක සාක්ෂරතාවය/ පුහුණුව<br>ශ්‍රී ලංකා පරිගණක මෙහෙයුම් බලපත්‍රය දැරීම | 02 |
| ඉංග්‍රීසි දැනුම | 02 |
| වෘත්තීය සුදුසුකම්<br>සහතික පත්‍ර 01<br>ඩිප්ලෝමා 02<br>කෘෂිකර්ම උපාධිය 03<br>විශේෂ පන්තියට උසස් කිරීමේ විභාගය සමත් වීම 03<br>වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය 04<br>පශ්චාත් උපාධිය 05 | 05 |
| රැකියා ක්ෂේත්‍රයට අදාල සේවාවන්හි පුහුණුවීම් වලට සහභාගිවීම එක් පුහුණුවකට 01 බැගින් | 05 |
| රැකියා ක්ෂේත්‍රයට අදාල ආයතනයකට / ජාතික වශයෙන් එළිදක්වන ලද නව නිර්මාණ | 06 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 |
| එකතුව | 100 |

03. පවත්වනු ලබන බලධරයා: සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :අවශ්‍යතාවය පරිදි වසරකට වරක්

අත්සන: ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : ....................කේ. සී. කරවිට

තනතුර : ....................පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමුව) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මුවගම - රත්නපුර

දිනය : ....2019.03.13....................

නිල මුද්‍රාව : ..........................................

යොමු අංකය :- ගsES/13/3/28
සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14.........දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

ඇමුණුම 07

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණ සේවා ගණය (කෘෂිකර්ම උපදේශක) ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය

01. නිලධරයා පිළිබඳ තොරතුරු

1.1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :

1.2. හැඳුනුම්පත් අංකය :

1.3. සේවා ස්ථානය හා එහි ලිපිනය :

1.4. අයත්වන සේවය හා තනතුර :

යොමු අංකය :- ගS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය :

02. පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්වීම් දිනය :

2.2 පත්විම ස්ථිර කළ දිනය :

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීනතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීනතා මට්ටම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |
| | | |

03.උසස්වීමට අදාල තොරතුරු

3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I / විශේෂ

3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

3.3.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.3.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය :

3.3.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව් / නැත

3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත

3.3.5 විනය දඬුවම් ලබා තිබේද ? ඔව් / නැත

04. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් .................................. දින සිට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ : II / I /විශේෂ ශ්‍රේණියට උසස්වීමට අදාල සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය: .................................... ....................................
නිලධරයාගේ අත්සන

05. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් ..................................................................................................................................................................................
........මහතා/මෙනවිය/මහත්මිය ................................................................................ සේවා ගණයේ ............................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත් වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශකර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ..........................................
අත්සන : ..........................................
දිනය : ..........................................
නිල මුද්‍රාව : ......................................

06. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් /නිවැරදි නොවන බවත් ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් /එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

යොමු අංකය :- සප/ES/1/3/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

දිනය:- 2019.05.17 ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

නම : ..........................................
අත්සන : ..........................................
දිනය : ..........................................
නිල මුද්‍රාව : ......................................

ඇමුණුම 08

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ සහකාර තාක්ෂණ සේවා ගණය (කෘෂිකර්ම උපදේශක )සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ 14 වන ඡේදය ප්‍රකාරව අන්තර්ග්‍රහණය සඳහා වූ අයදුම්පත්‍රය

01 (අ) නිලධාරියාගේ සම්පූර්ණ නම :-

(ආ) මුලකුරු සමග නම : -

(ඇ) පත්වීම් ලැබීමෙන් පසු නම වෙනස් කර භාවිතා කිරීම සඳහා අවසර ලබා ගෙන ඇත්තේ නම් කලින් භාවිතා කළ නම

02. උපන් දිනය :-

03. දැනට සේවය කරන ස්ථානයේ ලිපිනය :-

04. සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා ලැබූපත්වීම/ උසස් වීම් පිළිබඳ තොරතුරු :-

(1) ( අ ) III වන පන්තියට ස්ථිර පත්විම ක්‍රියාත්මක වූ දිනය :-
(ආ) එම පත්වීමෙහි තනතුරු නාමය : -
(ඇ) එම පත්වීම් ලිපිය නිකුත් කර ඇති බලධාරියාගේ තනතුරු නාමය :-
(පත්වීම් ලිපියේ පිටපතක් ඇමිණිය යුතුය.)

(2) II වන පන්තියේ තනතුරකට උසස් වීමක් ලබා ඇති අයකු නම් පහත තොරතුරු ද දක්වන්න.

( අ ) II වන පන්තියේ උසස් වීම ක්‍රියාත්මක වූ දිනය :-
(ආ) එම උසස්වීම ලැබූහ තනතුරු නාමය : -
(ඇ) එම පත්වීම් ලිපිය නාකුත් කර ඇති බලධාරීයාගේ තනතුරු නාමය :-
(පත්වීම් ලිපියේ පිටපතක් ඇමිණිය යුතුය.)

(3) I වන පන්තියේ තනතුරකට උසස් වීමක් ලබා ඇති අයකු නම් පහත තොරතුරු ද දන්වන්න.

( අ I වන පන්තියේ උසස් වීම ක්‍රියාත්මක වූ දිනය :-
(ආ) එම උසස්වීම ලැබූහ තනතුරු නාමය : -
(ඇ) එම පත්වීම් ලිපිය නිකුත් කර ඇති බලධාරියාගේ තනතුරු නාමය :-
(පත්වීම් ලිපියේ පිටපතක් ඇමිණිය යුතුය.)

05. සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා වන I වන පන්තියේ තනතුරුකට උසස්වීමක් ලබා -------------------------- දිනට වසර හයක (06) සේවා කාලයක් හෝ වැටුප් වර්ධක (6) උපයාගෙන ඇති අයෙකු නම් එම උසස්වීම ක්‍රියාත්මක වූ දින සිට ............................... දින දක්වා කාලය තුළ සේවා කඩවීම් හෝ වැටුප් රහිත නිවාඩු පිට තැබීම සිදුවී ඇත්නම් එම කාල සීමාවන් පිළිබඳ තොරතුරු සඳහන් කරන්න

ඉහත තොරතුරු සත්‍ය බව සහතික කරමි.

දිනය :-

යොමු අංකය :- SS/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019 . 05 . 14 ..........දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019 . 05 . 17

.........................................................
අයදුම්කරුගේ අත්සන

06.දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ /ආයතන ප්‍රධානියාගේ ප්‍රකාශය

.................................................................................................................................... කාර්යාලයේ /දෙපාර්තමේන්තුවේ සේවය කරන කෘෂිකර්ම උපදේශක ........................... පන්තියේ ...........................................................................................................මයා/මිය/මෙනවිය විසින් ඉහත

සඳහන් කරන තොරතුරු නිලධාරියාගේ/නිලධාරිණියගේ පෞද්ගලික ලිපිගොණුවට අනුව නිවැරදි බැවින් ඔහු

/ඇය ................................................................ දින සිට කෘෂිකර්ම උපදේශක බඳවා ගැනීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි.

නම : .........................................

අත්සන : .........................................

දිනය : .........................................

නිල මුද්‍රාව : .........................................

යොමු අංකය :- සප/ES/13/3/28
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14.....දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:-2019.05.17